# ජාතික මෝස්තර මධ්‍යස්ථානය

## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# තනතුරු පුරප්පාඩු

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා සේවා සපයන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම මධ්‍යස්ථානයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. තනතුර - මෝස්තර සම්පාදක (තනතුරු සංඛ්‍යාව 04) MA 5-1**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ලලිත කලා, සැලසුම්කරණය, පරිසරය, නිෂ්පාදන සැලසුම්කරණය, කාර්මික සැලසුම්කරණය, වීදුරු සහ සෙරමික් සැලසුම්කරණය, ග්‍රැෆික් සැලසුම්කරණය, මූර්ති සැලසුම්කරණය, රෙදිපිළි සහ ඇඟලුම් සැලසුම්කරණය, ගෘහ භාණ්ඩ සැලසුම්කරණය, අභ්‍යන්තර සැලසුම්කරණය, ගෘහ උපකරණ සැලසුම්කරණය, පිත්තල වැඩ සැලසුම්කරණය, මැණික් හා ස්වර්ණාභරණ සැලසුම්කරණය, මැටි වැඩ සැලසුම්කරණය, ඇසුරුම් සැලසුම්කරණය පිළිබඳ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම උපාධියක්

**සමඟ**

නිර්මාණකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්ද. (උපාධිය ලැබීමෙන් පසු)

**වයස :**

අවු. 23ට නොඅඩු හා වයස අවු. 45 නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :**

MA 5-1 – 2025 – රු. (58740 - 10 x 1190 – 15 x 1360 – 11 x 1670 – 109,410)

**සටහන**

සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ආයතනය විසින් ගෙවනු ලබයි. සේවකයන් විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 8% කින් දායක විය යුතුය.

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් සමඟ 2026 ජුනි 15 දින හෝ ඊට පෙර අයදුම්පත් **සභාපති, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, නො. 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, තමන් පිළිබඳ දන්නා ඥාති සම්බන්ධතාවක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංකයන් අයදුම්පතේ සඳහන් කර එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. අදාල සහතිකවල ඡායා පිටපත් නොමැති හා අසම්පූර්ණ අයදුම්පත් භාරගනු නොලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**සභාපති,**
**ජාතික මෝස්තර මධ්‍යස්ථානය,**
**නො. 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව.**